// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1606/31 - 2009 ජුනි 19 වැනි සිකුරාදා - 2009.06.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනත**

212 වැනි වගන්තිය යටතේ සාදන ලද නියෝග

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 26 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී දේශීය ආදායම් පනතේ 212 වගන්තිය යටතේ සාදන ලද නියෝග.

රංජිත් සියඹලාපිටිය,
*වැඩබලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය.*

2009 ජුනි මස 16 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ දී ය.

නියෝග

2009 මැයි මස 01 වැනි දිනෙන් ආරම්භවන 2009 ජුනි මස 30 වැනි දිනෙන් අවසන් වන කාල පරිච්ඡේදය සඳහා සහ 2009 ජූලි මස 01 වැනි දින හෝ ඉන්පසු ආරම්භ වන්නා වූ සෑම කාර්තුවක් වෙනුවෙන් ම ගෙවිය යුතු, 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත මගින් අය කරනු ලබන ජාතිය ගොඩනැගීමේ බද්දෙන් තුනෙන් දෙකක කොටස, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 26 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙහි (ඕ) ඡේදයෙහි (iii) උපඡේදයේ කාර්යයන් සඳහා නිශ්චිත බද්දක් විය යුතු ය.

07-200

1A - G 011305— 1955 (2009/06)　　ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.